# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1982/7 - 2016 අගෝස්තු මස 30 වැනි අඟහරුවාදා - 2016.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වන වගන්තියේ (1) වන පරිච්ඡේදය මගින් සලසා දී ඇති ප්‍රතිපාදනවලට අනුව බන්ධනාගාර ප්‍රතිසංස්කරණ පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු පිළිබඳ විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මා වෙත පවරා දී ඇති රාජකාරීන් සහ කාර්යයන් හා දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රජයේ සංස්ථා, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යවරයා වෙත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන වගන්තියේ (5) වන පරිච්ඡේදය මගින් සලසා දී ඇති ප්‍රතිපාදන වලට අනුව 2016 අගෝස්තු මස 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත වගුව ප්‍රකාරව පවරා දෙනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. ස්වාමිනාදන්,
බන්ධනාගාර, ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන,
නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍ය.

2016 අගෝස්තු මස 25 වැනි දින,
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි
කිරීම හා හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

**පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීමේ රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු පනත්* |
|---|---|---|
| 1. අවතැන්වූවන් සඳහා අත්‍යවශ්‍ය සේවාවන් සැපයීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම | 1. තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය (නැගෙනහිර පළාත් දිස්ත්‍රික්ක) | පුද්ගලයින්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය පනත (1987 අංක 29) |
| 2. ගැටුම්වලින් හානියට පත් දේපළ හා තැනැත්තන් පුරුත්ථාපනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම | | |
| 3. ත්‍රස්තවාදී ක්‍රියාවන්හි යෙදී සිටි තැනැත්තන් නැවත සමාජගත කිරීම සඳහා ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම | | |

09-535


1A - G 24140 — 358 (2016/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.